# විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව

# දැන්වීමයි

## 2020/ 2021 අධ්‍යයන වර්ෂයේ විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා අයදුම්පත් කැඳවූ අවසන් දිනය, එනම් 2021 ජුනි මස 18 වැනි දින හෝ එදිනට පෙර අයදුම්පත් යොමු කිරීමට නොහැකි වූ සිසුන් වෙත කෙරෙන නිවේදනයයි

2020 ඔක්තෝම්බර් මස පවත්වන ලද අ.පො.ස. (උසස් පෙළ) විභාගයේ ප්‍රතිඵල මත 2020/ 2021 අධ්‍යයන වර්ෂයේ විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා අයදුම්පත් කැඳවීම 2021 ජුනි මස 18 වැනි දින අවසන් කරන ලදී. කෙසේ වෙතත් ඒ වන විට කොවිඩ්–19 වසංගත ව්‍යාප්තිය හේතුවෙන් රට තුළ පනවන ලද සංචරණ සීමා/ ඇඳිරිනීති තත්ත්වයන් හේතුවෙන් **2021 ජුනි මස 18 වැනි දින** හෝ එදිනට පෙර විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා අන්තර්ජාලය හරහා අයදුම් කිරීමට නොහැකි වූ සිසුන් හට අයදුම්පත් යොමු කිරීමට **2021 ජූලි මස 26 වැනි දින සිට 2021 ජූලි මස 30 වැනි දින** දක්වා සහන කාල සීමාවක් ලබා දීමට විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව තීරණය කර ඇත.

එම කාල සීමාව තුළ විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා අයදුම්කරන සිසුන් හට **2021 ජූලි මස 31 වැනි දින සිට 2021 අගෝස්තු මස 14 වැනි දින දක්වා** සති දෙකක (02) කාල සීමාවක් තුළ තමන් අයදුම් කළ අධ්‍යයන පාඨමාලා සහ විශ්වවිද්‍යාල සඳහා **"Uni-Codes"** අනුපිළිවෙළ අන්තර්ජාලය හරහා UGC ගිණුමට පිවිස එක් වරක් පමණක් වෙනස් කිරීමට අවස්ථාව ලබා දෙන බව තවදුරටත් කරුණාවෙන් දනුම් දෙමි.

**සභාපති**
**විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව**
**2021.07.22**